**<u>රුහුණ විශ්වවිද්‍යාල කොඩිය හා පීඨ කොඩි භාවිතා කිරීම පිළිබඳ උපදෙස් මාලාව</u>**

1. රුහුණ විශ්වවිද්‍යාලයීය කොඩිය භාවිත කළ හැකි අවස්ථා ;
   a) විශ්වවිද්‍යාලයේ සියළුම නිල උත්සව
   b) විශ්වවිද්‍යාලයේ නිල ශිෂ්‍ය සංගම්/සමිති හා සේවක සංගම්/සමිති විසින් සංවිධානය කරනු ලබන විශ්වවිද්‍යාලයේ උපකුලපති/නියෝජ්‍ය උපකුලපති විසින් අනුමත කරන ලද උත්සව

2. රුහුණ විශ්වවිද්‍යාලයීය පීඨ කොඩි භාවිතා කළ හැකි අවස්ථා;
   a) පීඨ මණ්ඩල විසින් අනුමත පීඨය තුල පවත්වන උත්සව
   b) පීඨ ශිෂ්‍ය සංගම් විසින් සංවිධානය කරනු ලබන පීඨාධිපති නිර්දේශ සහ උපකුලපති/ නියෝජ්‍ය උපකුලපති අනුමැතිය ලද වැඩසටහන්
   c) වෙනත් බාහිර ආයතන සමග එක්ව පීඨ විසින් සංවිධානය කරනු ලබන විශ්වවිද්‍යාලයීය අනුමැතිය ලද වැඩසටහන්

3. රුහුණ විශ්වවිද්‍යාල කොඩිය හා පීඨ කොඩි භාවිතා කළ යුතු ආකාරය;
   a) විශ්වවිද්‍යාලයීය සෑම නිල උත්සවයකදීම විශ්වවිද්‍යාලයීය කොඩියට ප්‍රමුඛස්ථානය දියයුතුය.
   b) විශ්වවිද්‍යාලයීය කොඩිය සමග සාමූහික වශයෙන් විශ්වවිද්‍යාල පීඨ කොඩි ඔසවන අවස්ථාවන්හිදී පීඨ කොඩි විශ්වවිද්‍යාලයීය කොඩියට දකුණු පසින් පීඨයන්හි නාමවල අකාරාදී පිළිවෙළට (ඉංග්‍රිසි හෝඩිය අනුව) එසවිය යුතුය.
   c) එකම අවස්ථාවකදී විශ්වවිද්‍යාලීය කොඩිය හා පීඨ කොඩි එකිනෙකට යාව පිහිටි කොඩි කණුවල ඔසවනු ලබන විට මුලින්ම එසවිය යුත්තේත්, අවසානයට පහත දැමීම කළ යුත්තේත් විශ්වවිද්‍යාලීය කොඩියයි.
   d) විශ්වවිද්‍යාලයීය කොඩිය ප්‍රදර්ශනය කිරීමෙන් තොරව පීඨ කොඩි ප්‍රදර්ශනය නොකළ යුතුය
   e) ඉහත 01 හා 02හි සඳහන් අවස්ථා හැර වෙනත් කිසිදු අවස්ථාවක විශ්වවිද්‍යාලයීය කොඩිය හෝ පීඨ කොඩි භාවිතා නොකළ යුතුය.
   f) විශ්වවිද්‍යාලයේ විධිමත් අවසරයකින් තොරව විශ්වවිද්‍යාලයීය කොඩිය. පීඨ කොඩි සහ ලාංඡන භාවිතා නොකළ යුතුය.
   g) විශ්වවිද්‍යාලයෙන් නිකුත් කරන විශ්වවිද්‍යාලයීය කොඩි හා පීඨ කොඩි හැරුණු විට බාහිරව නිර්මාණය කරන ලද කොඩි ප්‍රදර්ශනය නොකළ යුතුය.
   h) විශ්වවිද්‍යාලය සහභාගීවන බාහිර ආයතනික අවස්ථා සඳහා විශ්වවිද්‍යාලීය කොඩිය සමඟ පීඨ කොඩි භාවිතා කිරීමට අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා විශ්වවිද්‍යාලයෙන් නිසි අවසරය ලබා ගත යුතුය.

   නියමිත කාලය තුළ කොඩිය ආපසු භාරදීමට අපොහොසත් වුවහොත් එහිදි විශ්වවිද්‍යාලය විසින් නියම කරනු ලබන දඩ මුදලකට යටත් කරනු ලැබේ.